**ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 30 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 136.25 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 129.46 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 6.79 ක් හෙවත් සියයට 5 ක ප්‍රමාණයක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනය | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 96.65 | 90.88 | 5.77 | 5.97 |

| | | | | |
|---|---|---|---|---|
| වියදම | 39.60 | 38.58 | 1.02 | 2.58 |
| | ------- | ------- | ------ | |
| **එකතුව** | **136.25** | **129.46** | **6.79** | **4.98** |
| | ===== | ===== | === | |

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 23601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 7.83 | 5.54 | 3.83 | 5.58 | 25.00 | 15.98 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0272/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 1.94 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0001/0087/000 දරන තැන්පත් ගිණුමේ ශේෂය රු. මිලියන 0.06 ක් විය.

## 2.5 විගණන නිරීක්ෂණය

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.	ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

**3.1	විසර්ජන ගිණුම**

-----------------

**අයවැය විචලනය**

--------------------

වැය විෂයයන් 11 ක් සඳහා එකතුව රු.1,304,218 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.2	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------------

විෂය අංක 23601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව 2012 නොවැම්බර් මාසයේදී වෛද්‍ය නිවාඩු ලබා ගෙන තිබුණු නිලධාරිනියකගෙන් අයවිය යුතු රු.74,116 ක ආපදා ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3	කාර්යසාධනය**

-----------------

රාජ්‍ය නිලධාරීන්ට භාෂා ප්‍රවීනතාවය ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් 'e' Learning යන දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය පෞද්ගලික ආයතනයක් සමඟ ඒකාබද්ධව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී හඳුන්වා දී තිබුණි. ඒ සඳහා වූ රු.800,000 ක ප්‍රතිපාදනවලින් 2014 වර්ෂයේදී රු.721,497 ක් උපයෝජනය කර භාෂා විද්‍යාගාරයට පරිගණක උපාංග හා කාර්යාල ගෘහ භාණ්ඩ ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4	කළමනාකරණ දුර්වලතා**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** කලින් මුද්‍රණය කරන ලද ත්‍රිභාෂා ශබ්දකෝෂයේ සිංහල ශීර්ෂ වචන සහිත ශබ්දකෝෂ 808 ක් හා දෙමළ ශීර්ෂ වචන සහිත ශබ්දකෝෂ 1096 ක් විකිණීමෙන් තොරව ඉතිරිව තිබුණි. නමුත් සංවර්ධනය කරන ලද සිංහල, දෙමළ ශීර්ෂ වචන සහිත ත්‍රිභාෂා ශබ්දකෝෂ පිටපත් 1000 ක් මුද්‍රණය කිරීමට 2015 දෙසැම්බර් 01 දින රු.6,438,000 ක් ගෙවා තිබුණි. 2016 ජූලි 8 දින වන විටත් එම මුද්‍රණය කරන ලද ශබ්ද කෝෂ දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 15 දින මුදල් ගෙවා ඇණවුම් කළ I මට්ටමේ සිංහල පොත් 5,000 කින් ද, II මට්ටමේ සිංහල පොත් 5000 කින් ද, අධ්‍යුකර සිංහල අකුරු පොත් 5000 ක් සහ දෙමළ අකුරු පොත් 5000 ක් මුද්‍රණය කිරීමට ඇණවුම් කිරීම "විද්වත් කමිටු වාර්තා හා අමාත්‍ය මණ්ඩලයේ තීරණ අනුව කළ බව රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් අදහස් දක්වා තිබුණි." එසේ වුවද, ඇණවුම් කරන අවස්ථාවේදීම අදාළ තීරණ නොගැනීම සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 06 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 58 | 13 | 45 |
| (iii) | ද්විතියික මට්ටම | 154 | 129 | 25 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 14 | 5 |
| | **එකතුව** | **242** | **162** | **80** |